රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Provincial Councils and Local Government

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව   சுதந்திர சதுக்கம், கொழும்பு 07,இலங்கை.  Independence Square, Colombo 07, Sri Lanka

දුරකථන / தொலைபேசி / Telephone: 011-2696211-13, 011-2166000
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2695279
ඊ-මේල් / மின்னஞ்ச / E-mail: info@pubad.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Telephone: www.pubad.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No | MPA/SSD/12/RECRU/9938 (VI) | ඔබේ අංකය / உமது இல / Your No | | දිනය / திகதி / Date | 2026.09.16 |

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ
ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ නිලධරයන් වෙත

**<u>ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සහ සැක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂක තනතුරට පත් කිරීම</u>**

උක්ත කරුණට අනුව ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සහ සැක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂක තනතුරට පත් කිරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

02. ඒ අනුව ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ සුදුසුකම් සපුරා ඇති නිලධරයන්ට මේ සඳහා ඉල්ලුම් කළ හැකි බවත් කාරුණිකව දන්වා සිටිමි.

**03.** තවද මේ අදාළ අයදුම්පත්‍රය **www.pubad.gov.lk** ඔස්සේ ද බා ගත කළ හැකිය.

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන අංකය / ෆැක්ස් : 0112-695187
විද්‍යුත් ලිපිනය : pubadssd@gmail.com

Officers of Grade I of Sri Lanka Scientific Service

in the Government Analyst's Department,

**Promotion to the Special Grade of Sri Lanka Scientific Service in the Government Analyst's Department and Appointment to the Post of Government Examiner of Questioned Documents**

In accordance with the above subject, applications are hereby called for the promotion to the Special Grade of Sri Lanka Scientific Service in the Government Analyst's Department and appointment to the post of Government Examiner of Questioned Documents.

2. Accordingly, I kindly inform you that officers who have fulfilled the required qualifications in Grade I of Sri Lanka Scientific Service of the Government Analyst's Department are eligible to apply for this.

3. Furthermore, the relevant application can be downloaded via www.pubad.gov.lk.

Sgd/S. Alokabandara
Secretary
Ministry of Public Administration, Provincial Councils and Local Government

Telephone / Fax: 0112-695187
Email: pubadssd@gmail.com

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ නිලධරයන් ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව මත එම සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම හා තනතුරට පත් කිරීම

අංක 1877/27 දරන 2014 අගෝස්තු මස 28 දිනැති ගැසට් පත්‍රයේ පළ කරන ලද, 1996/25 හා 2016 දෙසැම්බර් මස 06 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයෙන් සංශෝධනය කරන ලද 2006.01.01 දින සිට බලාත්මක වන ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 10.3 වගන්තිය හා අනුමත බඳවා ගැනීම් පටිපාටිවල විධිවිධාන ප්‍රකාරව, ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින සැක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂක තනතුරේ පුරප්පාඩුව සඳහා 2026.10.02 දිනට 02 ඡේදය යටතේ දක්වා ඇති නියමිත සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ සේවයේ නියුතු සුදුසුකම්ලත් නිලධරයෙකු එම සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම හා තනතුරට පත් කිරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. පුරප්පාඩු සංඛ්‍යාව:

| අනු අංකය | අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු | තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව | කාරණය |
|---|---|---|---|---|
| 01 | ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව | සැක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂක | 01 | විශේෂ ශ්‍රේණියට උසස් කිරීම හා තනතුරට පත් කිරීම |

02. උසස් කිරීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම්.

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති ආයතනයකින් අධිකරණ විද්‍යාත්මක ලේඛන පරීක්ෂාව පිළිබඳ පශ්චාත් උපාධිය හෝ ව්‍යෝහාරික පරිගණක තාක්ෂණය හෝ ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ විෂය ක්ෂේත්‍රයට අදාළව පරිගණක විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය ලබා තිබීම

II. උසස්වීම් සඳහා සුදුසුකම් ලබන දිනට ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ වසර පහක (05) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා පළමු ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වැටුප් වර්ධක පහක් (05) උපයාගෙන ඇති නිලධරයෙකු වීම.

III. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ වසර 18කට නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

IV. උසස්වීම් සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්න වසර පහක් (05) තුළ වාර්ෂික කාර්ය සාධනය සතුටුදායක හෝ ඉහළ මට්ටමක පැවතීම.

V. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ: 01/2020 හා ඊට අනුශංගික චක්‍රලේඛයන්හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

VI. තනතුරට පත් කිරීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම්

| අනු අංකය | දෙපාර්තමේන්තුව / අමාත්‍යාංශය | තනතුර | සුදුසුකම |
|---|---|---|---|
| 01 | ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව | සැක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂක | I සිට V දක්වා සියලුම සුදුසුකම් සම්පූර්ණ කරනු ලැබූ ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ සැක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ නියෝජ්‍ය පරීක්ෂක තනතුර දරණ අයෙකු විය යුතුයි |

03. උසස් කිරීමේ ක්‍රමය.

(i) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සම්මුඛ පරීක්ෂණයට භාජනය කර එහි ප්‍රතිඵල හා පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව විශේෂ ශ්‍රේණියට උසස් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබයි.

(ii) සම්මුඛ පරීක්ෂණයේදී ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව ඇගයීමට ලක් කරනු ලැබේ. ඒ සඳහා ඇමුණුම I හි වන ලකුණු පරිපාටිය යොදා ගනු ලැබේ.

(iii) මෙම පුරප්පාඩුව සම්පූර්ණ කිරීමේ දී අයදුම්කරුවන් කිහිපදෙනෙකු සම ලකුණු ලබාගතහොත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019(II) ප්‍රකාරව එකී සම ලකුණු ලබාගත් අයදුම්කරුවන්ට පමණක් සීමා වූ අමතර කුසලතා - පාදක සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනීම සිදු කරනු ලැබේ. ඒ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ඇගයීම් නිර්ණායක හා ලකුණු පරිමාණයක් උපයෝගී කර ගනු ලැබේ. අදාළ අයදුම්කරුවන්ට මෙම ඇගයීම් නිර්ණායක හා ලකුණු පරිමාණය පිළිබඳව එම අවස්ථාවේ දී පූර්ව දැනුවත් කිරීමක් සිදු කරනු ලැබේ.

04. රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, (ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1877/27 දරන 2014.08.28 දිනැති ගැසට්පත්‍රයේ පළ කරන ලද) ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවා ව්‍යවස්ථාවේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කෙරෙන හෝ සංශෝධනවලට ද යටත්ව, ඉහත කී සම්මුඛ පරීක්ෂණයෙන් අනතුරුව තෝරා ගනු ලබන නිලධරයින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ දිනයේ සිට ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

05. සම්මුඛ පරීක්ෂණයේ දී එක් එක් තනතුරට අදාළව ඉහළම ලකුණු ලබාගෙන ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කරනු ලබන නිලධරයා / නිලධරයින් අතුරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව පත්වීම් බලධරයා වන තනතුරු සඳහා අදාළ තනතුරුවල රාජකාරි භාර ගන්නා දින සිට ක්‍රියාත්මක වන පරිදි අදාළ තනතුරුවලට පත් කිරීම එම කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබයි.

06. මෙම නිවේදනයේ දක්වා ඇති අවම සුදුසුකම් සපුරාලන දැනට සේවයේ නිරත නිලධරයන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

07. පහත ආකෘතිය අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය අමාත්‍යාංශ ලේකම් / දෙපාර්තමේන්තු ප්‍රධානී දෙපාර්තමේන්තු ප්‍රධානී වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු ඉදිරිපිට අත්සන් කර එම අත්සන අමාත්‍යාංශ ලේකම් / දෙපාර්තමේන්තු ප්‍රධානී මගින් සහතික කර අමාත්‍යාංශ ලේකම් / දෙපාර්තමේන්තු ප්‍රධානී නිර්දේශය ද සහිතව, ලියාපදිංචි තැපෑලෙන් 2026.10.02 දිනට හෝ එදිනට පෙර ලැබෙන පරිදි " ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, නිදහස් චතුරශ්‍රය ,කොළඹ 07 " යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම හා තනතුරට පත් කිරීම" යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය. එදිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාර නොගන්නා අතර, අයදුම්පත්‍ර අස්ථානගත වීම හෝ ප්‍රමාදවීම සම්බන්ධයෙන් පැමිණිලි ද භාර ගනු නොලැබේ.

08. මෙම නිවේදනයෙහි සිංහල, දෙමළ, ඉංග්‍රීසි පිටපත්වල කරුණු අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් සිංහල පිටපත බලාත්මක වේ.

අයදුම්පත්‍රය www.pubad.gov.lk ඔස්සේ ද බා ගත කල හැකිය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
2026 සැප්තැම්බර් 11

**ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම හා තනතුරට පත් කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයේ ලකුණු පරිපාටිය**

| පරීක්ෂා කර ලකුණු ලබා දෙන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | මුළු ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| **1. ජ්‍යෙෂ්ඨතාව** | | **50** |
| I.1. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සක්‍රීය හා සතුටුදායක සේවා කාලය සඳහා ලකුණු ලබා දේ.<br>➢ ජ්‍යෙෂ්ඨතම නිලධාරියා සඳහා උපරිම ලකුණු ප්‍රමාණය ලබා දෙනු ලැබේ.<br>➢ අනෙකුත් නිලධරයන් සඳහා ජ්‍යෙෂ්ඨතාවය = (ජ්‍යෙෂ්ඨතාවය සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු / ජ්‍යෙෂ්ඨතම නිලධරයාගේ I ශ්‍රේණියේ අමතර සේවා කාලය (අවුරුදු x12+මාස)) x අදාළ නිලධරයාගේ I ශ්‍රේණියේ අමතර සේවා කාලය (අවුරුදු x12+මාස) | 50 | |
| **2. කුසලතාව** | | **50** |
| I. පර්යේෂණාත්මක ප්‍රකාශන (Research Publications) – (ක්ෂේත්‍රයට අදාළව සිදු කරන ලද කේවල හෝ කණ්ඩායම් වශයෙන් සිදුකරන ලද) | | |
| ➢ දේශීයව පළකරන ලද පර්යේෂණාත්මක ප්‍රකාශන ( Local Research Publications ) – එක් පර්යේෂණාත්මක ප්‍රකාශනයක් සඳහා ලකුණු 02 බැගින් උපරිම ප්‍රකාශන 2ක් සඳහා | 04 | |
| ➢ ජාත්‍යන්තරව පළකරන ලද පර්යේෂණාත්මක ප්‍රකාශන ( International Research Publications ) – එක් පර්යේෂණාත්මක ප්‍රකාශනයක් සඳහා ලකුණු 03 බැගින් උපරිම ප්‍රකාශන 2ක් සඳහා | 06 | |
| II. සාරාංශ (Abstracts) - ( ක්ෂේත්‍රයට අදාළව සිදු කරන ලද ) | | |
| ➢ ශ්‍රී ලංකාව තුළ (Local ) – එක් සාරාංශයක් සඳහා ලකුණු 02බැගින් උපරිම සාරාංශ 2ක් සඳහා) | 04 | |
| ➢ ජාත්‍යන්තර (International ) - එක් සාරාංශයක් සඳහා ලකුණු 2.5 බැගින් උපරිම සාරාංශ 2ක් සඳහා | 05 | |
| III. නිබන්ධන - ( ක්ෂේත්‍රයට අදාළව සිදු කරන ලද ) | | |
| ➢ එක් නිබන්ධනයක් සඳහා ලකුණු 04 බැගින් උපරිම නිබන්ධන 1ක් සඳහා (සැ.යු : දෙවන කාර්යක්ෂමතා කඩඉම හෝ I ශ්‍රේණියට උසස් වීමට සලකනු ලැබූ පශ්චාත් උපාධිය සඳහා ඉදිරිපත් කරන ලද නිබන්ධනය හැර වෙනත් නිබන්ධන සඳහා පමණක් ලකුණු ලබා දේ) | 04 | |
| IV. නව්‍යතා / නවෝත්පාදනයන් - ( ක්ෂේත්‍රයට අදාළව සිදු කරන ලද ) | | |
| ➢ එක් නව්‍යතා / නවෝත්පාදනයක් සඳහා ලකුණු 04 බැගින් උපරිම නව්‍යතා / නවෝත්පාදනයන් 2ක් සඳහා) | 08 | |

| | | |
|---|---|---|
| "සටහන - අදාළ නිලධරයන්ගේ මූලිකත්වයෙන් සාර්ථකව ක්‍රියාත්මක වූ නවෝත්පාදනයන් බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් තහවුරු කළයුතු අතර එය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ඇගයීමට ලක්කර නව්‍යතාවක් හෝ නවෝත්පාදනයක් යන්න තහවුරු කර ගැනීමෙන් අනතුරුව ලකුණු ලබා දෙනු ලැබේ."<br><br>V. පුවත්පත් / සඟරා ලිපි - ( ක්ෂේත්‍රයට අදාළව සිදු කරන ලද )<br><br>➢ එක් පුවත්පතක් / සඟරා ලිපියක් සඳහා ලකුණු 02 බැගින් උපරිම පුවත්පත් / සඟරා ලිපි 2ක් සඳහා | 04 | |
| VI. තෝරාපත් කරන තනතුරෙහි කාර්ය භාරය සඳහා දායකත්වය දක්වන ආකාරය සම්බන්ධයෙන් පරිගණකය ආශ්‍රයෙන් සිදු කරනු ලබන විනාඩි 10ක ඉදිරිපත් කිරීම (Power Point Presentation)<br><br>I. අදාළත්වය (Relevancy) - ලකුණු 03<br>II. නිර්මාණශීලීත්වය / (Creativity ) - ලකුණු 03<br>III. ඒ සඳහා හඳුන්වාදෙන නව්‍යතා හා නව යෝජනා (Innovations & Suggestions) - ලකුණු 03<br>IV. කාල කළමනාකරණය (Time Management) - ලකුණු 03<br>V. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව (Proficiency in English) - ලකුණු 03<br><br>සටහන -<br><br>අ) ඉහත (v) නිර්ණායකය යටතේ ලකුණු ලබා ගත හැක්කේ අයදුම්කරු ඉංග්‍රීසි භාෂාව මගින් මෙම ඉදිරිපත් කිරීම සිදු කරන්නේ නම් පමණි.<br>ආ) ඉදිරිපත් කිරීමට අදාළ දෘඪ පිටපත (Hard Copy) සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට එම අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතුය. අමතර වශයෙන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් සකසන ලද ඉදිරිපත් කිරීමේ දෘඪ පිටපතක් ද මෙම අවස්ථාවේ දී ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ. | 15 | |
| **මුළු ලකුණු** | | **100** |

**ආදර්ශ අයදුම්පත්‍රය**

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විශේෂ ශ්‍රේණියට උසස්වීම හා සැක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂක තනතුරට පත් කිරීම සඳහා ඉල්ලුම් කිරීම

1. නිලධරයා සම්බන්ධ තොරතුරු
   i. සම්පූර්ණ නම: (ඉංග්‍රීසි කැපිටල් අකුරින්):.........................................................................
   .............................................................................................................................
   (උදා: HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)
   ii. මුලකුරු සමඟ නම: ( ඉංග්‍රීසි කැපිටල් අකුරින්)Mr./Mrs./Miss:.........................................
   .............................................................................................................................
   (උදා: GUNAWARDHANA, H. M. S. K.)
   iii. සම්පූර්ණ නම (සිංහලෙන්):...............................................................................................
   .............................................................................................................................
   iv. උපන් දිනය:..............................................................
   v. අයදුම්පත භාර ගන්නා අවසන් දිනට වයස: අවු........... මාස................දින...................
   vi. ජාතික හැඳුනුම්පත් අංකය : ...........................
   vii. ස්ථිර ලිපිනය :..........................................................................................................
   .............................................................................................................................
   viii. දුරකථන අංකය : කාර්යාලය : .......................... ජංගම :..................................
   ix. විද්‍යුත් ලිපිනය:…………………………………………………………………………

2. තනතුර පිළිබඳ තොරතුරු :
   i. වර්තමාන සේවා ස්ථානය හා ලිපිනය :
   ii. III ශ්‍රේණියට පත්වීම් ලබා ඇති දිනය :
   iii. II ශ්‍රේණියට පත්වීම් ලබා ඇති දිනය :
   iv. I ශ්‍රේණියට පත්වීම් ලබා ඇති දිනය:
   v. දැනට දරන තනතුර:
   vi. එම තනතුරට පත් වූ දිනය:
   vii. .................. දිනට III ශ්‍රේණියේ සේවා කාලය :
   viii. ................... දිනට I ශ්‍රේණියේ සේවා කාලය :

3. යෝග්‍යතාව

| | | |
|---|---|---|
| 01 | අයදුම්පත් කැඳවන අවසාන දිනට ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සක්‍රීය හා සතුටුදායක සේවා කාලය | |
| 02 | අයදුම්පත් කැඳවන අවසාන දිනට ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ සක්‍රීය හා සතුටුදායක සේවා කාලය | |
| 03 | වැටුප් රහිත නිවාඩු ලබා ඇති / නැති බව (වැටුප් රහිත නිවාඩු ලබා ඇත්නම් ලබා ඇති දින සඳහන් කරන්න) | |

4. ක්ෂේත්‍රයට අදාළ සුදුසුකම්:

4.1. අදාළ ක්ෂේත්‍රය සඳහා දක්වන ලද විශේෂ දායකත්වය

| ❖ පර්යේෂණ හා ප්‍රකාශන | විස්තර | අදාළ වර්ෂය |
|---|---|---|
| පර්යේෂණාත්මක ප්‍රකාශන<br>I. දේශීයව පළකරන ලද පර්යේෂණාත්මක ප්‍රකාශන<br>II. ජාත්‍යන්තරව පළකරන ලද පර්යේෂණාත්මක ප්‍රකාශන | | |
| සාරාංශ<br>I. ශ්‍රී ලංකාව තුළ<br>II. ජාත්‍යන්තර | | |
| නිබන්ධන | | |
| නව්‍යතා / නවෝත්පාදනයන් | | |
| පුවත්පත් ලිපි | | |

❖ පර්යේෂණ සාරාංශය සම්මුඛ පරීක්ෂණය අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතුය.

5. අයදුම්කරුගේ ප්‍රකාශය :

ඉහත සඳහන් තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි.

දිනය : .............................. .........................................

අයදුම්කරුගේ අත්සන

II කොටස

(අමාත්‍යාංශ ලේකම් / දෙපාර්තමේන්තු ප්‍රධානී විසින් සම්පූර්ණ කළයුතු වේ.)

........................................................................ අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ නිලධාරී .................................................................................. මයා / මිය/ මෙනවිය විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පතෙහි සඳහන් තොරතුරු පෞද්ගලික ලිපිගොනුවෙහි ඇති තොරතුරු අනුව නිවැරදිය / වැරදිය. ඔහුට / ඇයට විරුද්ධව විනය ක්‍රියාමාර්ග කිසිවක් නොමැති / ගෙන ඇති බවත්, එවැනි ක්‍රියාමාර්ග ඉදිරියේ දී ගැනීමට අදහස් කර නොමැති / ඇති බවත්, අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 05ක වැටුප් වර්ධක උපයාගෙන ඇති / නැති බවත්, කාරුණිකව දන්වා සිටිමි. ඔහුගේ / ඇයගේ අයදුම්පත නිර්දේශ කරමි / නොකරමි.

.......................................................

අමාත්‍යාංශ ලේකම්ගේ / දෙපාර්තමේන්තු ප්‍රධානීගේ අත්සන

නිල මුද්‍රාව

දිනය

## Public Service Commission

## Promotion of Officers in Grade 1 of the Sri Lanka Scientific Service to Special Grade on the basis of Seniority and Merit and Appointment to the Post

As per the provisions in Section 10.3 of the Minute of the Sri Lanka Scientific Service, effective from 01.01.2006, which was published in Gazette No. 1877/27 on 28th August 2014 and revised by Gazette Extraordinary No. 1996/25 dated 06th December 2016, and the provisions in the approved schemes of recruitment, applications are called from qualified officers in active service in Grade I of the Sri Lanka Scientific Service, who have satisfied the qualifications specified under Paragraph 02 as at 02.10.2026, for promotion to Special Grade of the said service and filling the vacancy in the post of Government Examiner of Questioned Documents at Department of Government Analyst.

01. Number of Vacancies:

| S/No | Ministry/ Department | Post | Number of Vacancies | Subject |
|---|---|---|---|---|
| 01 | Department of Government Analyst | Government Examiner of Questioned Documents | 01 | Promotion to the Special Grade and appointment to the post |

02. Qualifications to be satisfied for Promotion.

I. Shall have obtained a postgraduate degree in Questioned Document Examination in Forensic Science, or in Forensic Computer Technology, or in Computer Science relevant to the field of the Government Analyst's Department, from a university recognized by the University Grants Commission or from an institution recognized by the University Grants Commission as a degree-awarding body.

II. Shall have completed five (05) years of active and satisfactory service in Grade I of the Sri Lanka Scientific Service on the date of qualification for promotion and shall have earned five (05) salary increments after promotion to Grade I.

III. Shall have completed at least 18 years of active service in Sri Lanka Scientific Service on the date of satisfying the qualifications for promotion.

IV. Shall have proved an annual performance at satisfactory level or above within the five (05) years immediately preceding the date of satisfying the qualifications for promotion.

V. Shall have not been subject to any disciplinary punishment as per the provisions in Public Service Commission Circular No. 01/2020.

VI. Qualifications to be satisfied for appointment to the post

| S/N | Department/ Ministry | Post | Qualification |
|---|---|---|---|
| 01 | Department of Government Analyst | Government Examiner of Questioned Documents | Must be a person holding the post of Deputy Government Examiner of Questioned Documents of the Government Analyst's Department who has fulfilled all the qualifications from I to V. |

03 Method of Promotion

(i) The Public Service Commission carries out the promotion to Special Grade considering the result of the interview conducted by an interview board approved by the Public Service Commission and the number of vacancies.

(ii) Seniority and merit will be evaluated at the interview. The marking scheme in Annex I is used for this purpose.

(iii) In case where several candidates secure equal marks when filling the vacancies, selection shall be made through an additional merit-based interview limited for the candidates, who have secured equal marks, as per Public Service Commission Circular 01/2019 (II). A Board of Interview appointed by the Public Service Commission shall use an assessment criterion and marking scheme approved by the Commission for this purpose. The relevant candidates shall be made aware of this assessment criterion and marking scheme prior to the commencement of the interview.

04. An officer who is selected after the above mentioned interview subject to the general conditions by which the appointments of the public service are governed (Published in the Gazette of the Democratic Socialist Republic of Sri Lanka No: 1877/27 dated 28.08.2014), the terms and conditions of the Minute of the Sri Lanka Scientific Service and the revisions made and to be made in the future to the said Service Minute, shall be promoted to the Special Grade of the Sri Lanka Scientific Service with effect from the date of the structured interview based on the number of existing vacancies.

05. The officer who is promoted to the Special Grade of the Sri Lanka Scientific Service upon securing the highest marks in respect of the above vacant post at the interview shall be appointed to the post by the Public Service Commission, with effect from the date of assuming duties of the relevant post.

06. Only the officers who satisfy the minimum qualifications indicated in this notification and who are in service at present shall be called for the interview.

07. Applications perfected in line with the format given below should be sent to reach Secretary, Ministry of Public Administration, Provincial Councils and Local Government, Independence Square, Colombo 07” on or before 02.10.2026 via registered post with the recommendation of the Secretary of the Ministry/ Head of the Department, having attested the signature placed before the Secretary of the Ministry/ Head of the Department or an authorized officer to sign for the Secretary of the Ministry/ Head of the Department, by the Secretary of the Ministry/ Head of the Department. The words “Promotion to the Special Grade in Sri Lanka Scientific Service” should be clearly indicated on the top left corner of the envelope in which the application is sent. No application

received after the said date shall be accepted and complaints on misplaced or lost applications shall not be entertained.

08. In the event of any inconsistency between Sinhala, Tamil and English texts of this notice, Sinhala text shall prevail.

Application can also be downloaded via www.pubad.gov.lk

On the order of the Public Service Commission,

Sgd/ S. Alokabandara
Secretary,
Ministry of Public Administration,
Provincial Councils and
Local Government
11 September 2026

**The marking scheme of the interview for promotion to Special Grade of the Sri Lanka Scientific Service and appointment to the post**

| Points for which marks are awarded | Maximum Marks | Total marks |
|---|---|---|
| 1. **Seniority** | | **50** |
| Marks are awarded for the active and satisfactory service period in Grade I of the Sri Lanka Scientific Service.<br><br>➢ Maximum marks are awarded to the most senior officer.<br><br>➢ Marks for the seniority of the other officers = (Maximum marks allocated for the seniority / Extra service period of the most senior officer (Years x12+Months)) × Extra service period of the relevant officer in Grade I (Yearsx12+months) | 50 | |
| 2. **Merit** | | **50** |
| 2.1<br><br>I. Research publications (Conducted individually or in groups in relation to the field)<br><br>➢ Local Research Publications - 02 marks for each for a maximum of 2 publications<br><br>➢ International Research Publications - 03 marks for each for a maximum of 2 publications<br><br>II. Abstracts – (work relevant to the field)<br><br>➢ Local - 02 mark for each abstract (for maximum of 02 abstracts)<br><br>➢ International - 2.5 marks for each abstract (for maximum of 02 abstracts)<br><br>III. Dissertation – (work relevant to the field)<br><br>➢ 4 marks for one dissertation (Maximum of 01 dissertation)<br>N.B. Marks will be awarded only for dissertations other than the dissertation submitted for the Second Efficiency Bar or Post Graduate degree considered for promotion to Grade I<br><br>IV. Innovations – (work relevant to the field)<br>4 marks for each innovation (Maximum of 2 innovations)<br><br>Note - An **innovation** includes making a new invention, introducing a laboratory testing methodology or improving an existing laboratory testing methodology and the Head of the Department should ensure that the innovations are successfully | <br><br><br><br>04<br><br>06<br><br><br><br>04<br><br>05<br><br><br><br>04<br><br><br><br><br>08 | |

| | | |
|---|---|---|
| implemented under the leadership of the relevant officers. Marks will be awarded after the interview board evaluates and confirms whether it is an innovation” | | |
| V. Newspaper / Magazine Articles – (work relevant to the field)<br>Articles written by the officer himself/herself to educate the public (02 marks for each newspaper / magazine)<br>(Maximum of 2 newspaper/ magazine articles) | 04 | |
| VI. Power Point Presentation of 15 minutes with the use of computer on the manner in which the officer intends to contribute to the role of the post to which he/ she is selected<br><br>i. Relevancy - 03 Marks<br>ii. Creativity - 03 Marks<br>iii. Innovations and suggestions - 03 Marks<br>iv. Time Management - 03 Marks<br>v. Proficiency in English - 03 Marks<br><br>Note -<br>a) Marks under Criteria (v) above can be obtained only if the applicant conducts the presentation in English language.<br>b) The hard copy of the presentation should be submitted to the interview board at the same time. In addition, it is compulsory to submit a hard copy of the presentation prepared in English at the same time. | 15 | |
| **Total Marks** | 100 | **100** |

Specimen Application

**Application for promotion to the Special Grade of the Sri Lanka Scientific Service and appointment to the post of Additional Director General of the Department of Meteorology**

Application for the promotion to Special Grade of Sri Lanka Scientific Service and appointment to the post of Director General at the Ministry of Science and Technology

1. Particulars of the Officer
    i. Name in Full in English (in block letters) ……………………………………..
    ........................................................................................................................
    (Ex: HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)
    ii. Name with initials in English (in block letters) ):......................................................
    ........................................................................................................................
    (Ex: GUNAWARDHANA, H. M. S. K.)
    iii. Name in Full (In Sinhala):.............................................................................................
    iv. Date of Birth:................................................................
    v. Age as at the Closing Date of Application: ..........Years ..........Months ..........Days
    vi. NIC No : ...........................
    vii. Permanent Address :...........................................................................................
    viii. Telephone No : Office : ..................... Mobile :..........................
    ix. Email:……………….
2. Particulars of the Post :
    i. Place of work at present and address :
    ii. Date of appointment to Grade III:
    iii. Date of appointment to Grade II:
    iv. Date of appointment to Grade I:
    v. Post held at present:
    vi. Date of appointment to the post:
    vii. Service period in Grade III as at 03.03.2026
    viii. Service period in Grade I as at 03.03.2026
3. Seniority

| | | |
|---|---|---|
| 01 | Period of active and satisfactory service in the Sri Lanka Scientific Service as at the closing date of applications | |
| 02 | Period of active and satisfactory service in Grade I of the Sri Lanka Scientific Service as at the closing date of applications | |
| 03 | Whether the officer has obtained/ has not obtained no-pay leave (Mention the dates of no-pay leave, if any) | |

4. Qualifications in the relevant field :

4.1. Special contribution made to the relevant field

| Researches and Publications | | Description | Year |
|---|---|---|---|
| Research Publications | Local Research Publications | | |
| | International Research Publications | | |
| Abstracts | Within Sri Lanka | | |
| | International | | |
| Dissertations | | | |
| Innovations | | | |
| Newspaper Articles | | | |

- ❖ Research abstract should be submitted at the time of interview

5. Declaration of the applicant

I hereby confirm that the above information is as true and correct to the best of my knowledge

Date : ..............................                                        ........................................

Signature of the Applicant

Part II

( Should be completed by the Secretary of Ministry/ Head of the Department)

Particulars in the application submitted by Mr/Mrs/Miss ………………………………………… an Officer in Grade I of Sri Lanka Scientific Service at the Ministry/ Department of ……………………………………….. are correct/incorrect as per the personal file. I kindly inform that disciplinary action has not been/has been taken against the officer, such action is / is not intended to be taken in the future, he/she has earned/not earned the immediately preceding 05 salary increments. I recommend/ do not recommend his/her application.

........................................................

Signature of the Secretary of the Ministry/ Head of the Department

Official Stamp

Date